# සිංහබාහුගේ පියා

සිංහබාහු ප්‍රවාදයෙහි වැදගත්කම කියා නිමකළ නොහැකි ය. බටහිරයන් අනුකරණය කරන කසිකබල් ඇංකරයන්ට නම් සිංහබාහු ප්‍රවාදය මිථ්‍යාවකි. සිංහයකුට දාව මිනිස් ස්ත්‍රියකට මිනිස් දරුවන් දෙදෙනකු නොව එක් කෙනකු වත් ඉපදිය හැකි නොවේ. සිංහබාහු ප්‍රවාදයෙහි සඳහන් අන්දමට සිංහබාහු තම නැගණිය වූ සිංහ සීවලී විවාහ කරගෙන ඇත. පඬුවන්ට අනුව එය සදාචාරයට එකඟ නොවේ. මේ කරුණු සලකා බලන කල සිංහබාහු ප්‍රවාදය ප්‍රතික්ෂේප කළ යුතු යැයි ඇංකරයෝ පවසති. එහෙත් කබරගොයා තලගොයා කරගැනීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ඔවුහු සිංහලයන්ට මඩගැසීමට අවශ්‍ය වූ කල සිංහබාහු ප්‍රවාදය යොදාගනිති. එවැනි අවස්ථාවල ඔවුන් කියන්නේ සිංහලයන් තිරිසනකුගෙන් පැවත එන බවත් විජයගේ දෙමව්පියන් නොසිදුවිය යුතු විවාහයක් කරගත් අශීලාචාරයන් බවත් ය.

එහෙත් අපට සිංහබාහු ප්‍රවාදය සමග අපේ ජාතිය ගැටගැසී ඇත. සිංහබාහු ප්‍රවාදය නැතහොත් කතන්දරය මුලින් ම නිර්මාණය කෙළේ කවුදැයි කීමට නොහැකි ය. එවැනි කතාවක් භාරතයේ ඇත් ද යන්න ද කිව නොහැකි ය. ඒ කුමක් වුවත් අඩුම තරමින් හතරවැනි සියවසේ සිට සිංහබාහු ප්‍රවාදය සිංහලයන් අතර තිබී ඇත. මේ ප්‍රවාදය ජනප්‍රවාදයක්, එනම් මහජනයා විසින් ගොතන ලද කතන්දරයක් විය හැකි ය. මේ ප්‍රවාදයට ද මුල ප්‍රශ්නයකි. පොල් ගෙඩි වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට නිව්ටන් විද්වතා පිළිතුරු දුන්නේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය මගිනි. සිංහබාහු ප්‍රවාදය සිංහලයාගේ සම්භවය කෙසේ සිදුවිණි ද යන්නට දෙන ලද පිළිතුරකි. මෙහි වැදගත්කම ඇත්තේ පිළිතුරෙහි මෙන් ම ප්‍රශ්නයෙහි ය.

දෙමළ ජනයාගේ සම්භවය පිළිබඳ කිසිදු කතාවක් මෙතෙක් ගොඩ නැගී නැත. දෙමළ ජනයා අතර දෙමළ ජනයාගේ සම්භවය පිළිබඳ ප්‍රශ්නය පැන නොනැගීමට හේතුව කුමක් ද? ලංකාවේ පමණක් නොව ඉන්දියාවේ ද දෙමළ ජනයාගේ සම්භවය පිළිබඳ කතාවක් ගෙතී ඇතැයි නොසිතමි. ලෝක ඉතිහාසයෙහි කිසි දිනෙක කිසිම රටක දෙමළ රාජ්‍යයක් තිබී නැත. එකල දකුණු ඉන්දියාවේ තිබුණේ චෝල, පල්ලව, චේර, පාණ්ඩ්‍ය ආදී රාජ්‍ය මිස දෙමළ හෝ අඩුම තරමින් ද්‍රවිඩ හෝ රාජ්‍යයක් නොවේ. දකුණු ඉන්දියාවේ දෙමළ ජාතික අනන්‍යතාවයක් තබා දෙමළ ජනවාර්ගික අනන්‍යතාවයක් වත් තිබී නැත. ලංකාවේ ද කිසිම දවසක දෙමළ රාජ්‍යයක් හෝ දෙමළ අනන්‍යතාවයක් තිබී නැත. යාපන අර්ධද්වීපයේ තිබූ ආර්ය චක්‍රවර්තී රාජ්‍යය දෙමළ හෝ ද්‍රවිඩ හෝ රාජ්‍යයක් නොවී ය. එහි රජු කවරකු වුවත් (ඔහු ද්‍රවිඩයෙක් නොව කාලිංග වංශිකයෙක් විය. ඒ කෙසේ වෙතත් රාජ්‍යයක් කිනම් ජනවර්ගයක ද යන්න තීරණය වන්නේ රජු මත නොව  වැසියන් මත ය. මහනුවර රාජ්‍යයෙහි අවසන් භාගයෙහි නායක්කාර් වාංශිකයන් රජ කළ ද එය සිංහල බෞද්ධ රාජ්‍යයක් වූයේ ඒ පදනමින් ය.) එහි විසුවෝ කේරලයෙන් පැමිණි මලයාලම් බස කතා කරන දෙමළ නොවන ද්‍රවිඩ ජනයා හා සිංහල ජනයා වූහ. පසුකලෙක ලන්දේසීන් විසින් ආනනයන කරන ලද දෙමළ ජනයා යාපන අර්ධද්වීපයේ පදිංචි වීමෙන් මේ ජන සංයුතිය වෙනස් විය. එහෙත් දෙමළ ජනයාට තිබූ මලයාලම් බලපෑම ඉවත නොගියේ ය. ඇතැම් දෙමළ උගතුන්ට අනුව අද පවා දකුණු ඉන්දියානු දෙමළ වැසියන් ලංකාවේ දෙමළ වැසියන් කතාකරනු ඇසුවහොත් කියන්නේ ලංකා දෙමළ උච්චාරණයෙහි මලයාලම් ඌරුවක් ඇති බව ය. ලංකා දෙමළ බසෙහි ඇතැයි කියන එහෙත් දකුණු ඉන්දියානු දෙමළ බසෙහි නැති ඇතැම් පැරණි සංගම් කාලීන දෙමළ වචනවලට ද හේතුව මේ මලයාලම් සම්බන්ධය යැයි සිතිය හැකි ය. මලයාලම් බස යනු දෙමළ බසෙන් කැඩී වෙන් වූ බසකි. එබැවින් මලයාලම් බසෙහි පැරණි දෙමළ බසෙහි තිබූ ඇතැම් වචන ආරක්ෂා වී ඇත. ලංකාවේ දෙමළ යනු ආර්යචක්‍රවර්තී යුගයෙහි මෙහි පැමිණි මලයාලම් බස කතා කළ කේරළ කුලී හමුදාවේ පුද්ගලයන්ගෙන් පැවත එන්නන්ගේ ද ඒ යුගයෙහි එහි විසූ සිංහලයන්ගෙන් පැවත එන්නන්ගේ ද ලන්දේසි යුගයෙහි දුම්කොළ වගාව සඳහා මෙරටට ගෙන්වන ලද පුද්ගලයන්ගෙන් පැවත එන්නන්ගේ ද  බස බැවින් එහි ඇතැම් පැරණි දෙමළ වචන තිබීම පුදුමයක් නොවේ.

දෙමළ රාජ්‍යයක් හෝ දෙමළ ජනවර්ගයක් හෝ දෙමළ ජාතියක් හෝ නොමැතිව දෙමළ නමින් අනන්‍යතාවයක් ඇති නොවේ. භාෂාව කෙතරම් වැදගත් වුව ද එකම භාෂාවක් කතා කළ පමණින් ජනතාවක් තුළ තමන් ජනවර්ගයක් ය යන විඥානයක් හෝ අනන්‍යතාවයක් හෝ ඇති නොවේ. එබැවින් එකම දෙමළ භාෂාව කතා කළ ද දකුණු ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල ජීවත් වූ ජනතාවට දෙමළ නමින් අනන්‍යතාවයක් තිබී නැත. දෙමළ අනන්‍යතාවයක් නැති විට

© Prof. Nalin De Silva

දෙමළ ජනවර්ගයක හෝ දෙමළ ජාතියක සම්භවය පිළිබඳ ප්‍රශ්න ඇසීමට ඉඩක් නැත. මේ කරුණ අප අවධාරණය කරන්නේ අඩුම තරමින් විවේචනය කිරීමට වත් මෙරට දෙමළ ජාතිවාදීන්ට දෙමළ සම්භවයක් පිළිබඳ කතාවක් ලංකාවෙන් නොව ඉන්දියාවෙන් වත් ඉදිරිපත් කළ නොහැකි බැවිනි.

සිංහලයන්ට සිංහලයන්ගේ සම්භවය පිළිබඳ ප්‍රවාදයක් අඩුම තරමින් හතරවැනි සියවසේ සිට තිබීමෙන් පෙන්නුම් කරන්නේ සිංහලයන් තමන් සිංහලයන් ලෙස අඩුම තරමින් ඒ යුගයේ සිට හඳුන්වාගෙන තිබීම ය. ඒ කාලයෙහි රටෙහි ඒකීය රාජ්‍යයක් ද (එක් සේසත්) තිබූ බැවින් සිංහලයන් ජනවර්ගයක් ලෙස නොව ජාතියක් ලෙස තමන් හඳුන්වාගෙන ඇති බව පැහැදිලි ය. සිංහබාහු ප්‍රවාදය නිර්මාණය කෙරී ඇත්තේ එසේ ජාතියක් ලෙස අනන්‍ය වූ සිංහලයන් තම සම්භවය පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ දී ය. ඒකීය රාජ්‍යය හා ජාතිය යනු දහසයවැනි සියවසෙන් මෙපිට යුරෝපයේ ඇති වූ සංකල්ප යැයි කියන්නන්ට අප ප්‍රකාශ කරන්නේ එක්සේසත් යන වචනය හා සිංහලයන් යන වචනය ඒ අදහස් ප්‍රකාශ කරන බව ය. සිංහබාහු ප්‍රවාදය පිළිතුරක් ලෙස මෙන් ම ප්‍රශ්නයක් ලෙස ද වැදගත් වන්නේ ඒ ප්‍රශ්නය අසන්නට සුදුසු වාතාවරණයක් එකල බිහි වී තිබීම හේතුකොටගෙන ය.

සිංහබාහු ප්‍රවාදය පිළිබඳ ව ඇතැම් ඊනියා උගත් සිංහලයෝ ම ලජ්ජාවට පත්වෙති. ඒ ප්‍රවාදය ගොඩ නගන ලද සිංහල භික්ෂූන්වහන්සේගේ හෝ සිංහල ගිහියාගේ හෝ ප්‍රඥාව නොමැති මේ අද බාල උගත්තු සිංහයාට විවිධ අර්ථකථන දෙති. එමගින් තම අද බාලකම හේතුවෙන් ප්‍රවාදයෙහි අගය අඩුකරති. මේ අද බාලයන්ට අනුව සිංහයකුට දාව මිනිස් ස්ත්‍රියකට මිනිස් දරුවන් ලැබිය නොහැකි ය. මොවුන්ගේ විශ්ලේෂණාත්මක බුද්ධියේ ආනුභාවයෙන් සිංහයා තිරිසන් අත්බවින් මිදී මිනිසකු බවට පත්වෙයි. මේ බොරු පණ්ඩිතයන්ට අනුව මෙහි සිංහයකු ලෙස දැක්වෙන්නේ සිංහයකු මෙන් ශක්තිය තිබූ මිනිසෙකි. ඇතැම් විට මේ මිනිසා චණ්ඩියකු වන්නට ඇත. කෙසේ වෙතත් විශාල ජවයක් තිබූ මේ මිනිසා සුප්පා දේවිය පැහැර ගෙනගොස් ඇය සමග කැලයේ ජීවත් විය. එසේත් නැත්නම් සිංහයකු වැනි මේ මිනිසාගේ හැඩි දැඩි සිරුරට ලොල් වූ සුප්පා දේවිය ඔහු සමග පැන යන්නට ඇත. ඒ කුමක් වුවත් පණ්ඩිතයන් ලෙස පෙනී සිටින මේ අද බාලයන්ට අනුව සුප්පා දේවිය දීග ගොස් ඇත්තේ සිංහයකු සමග නොව සිංහයකු මෙන් වූ මිනිසකු සමග ය.

සිංහයාට දෙන ඒ අර්ථ විවරණයන් සමග බටහිර ජීව විද්‍යාවේ විවේචනයෙන් මිදීමට පණ්ඩිතයන්ට හැකිවෙයි. මිනිසකුට දාව මිනිස් ස්ත්‍රියකට මිනිස් දරුවන් ලැබිය හැකි බැවින් සිංහබාහුට හා සිංහ සීවලීට දැන් හොඳ උප්පැන්න සහතිකයක් ලැබෙයි. එහෙත් ඒ උප්පැන්න සහතිකය සමග සිංහල ජාතියේ උප්පැන්න සහතිකය ඉරා දැමෙයි. සිංහබාහු ගේ පියා මිනිසකු නම් සිංහල ජාතියේ ආරම්භය සංකේතවත් කරන ආදි පියා කවු ද? සිංහයා ද මිනිසකු වන විට ඒ මිනිසාට ද තවත් මිනිස් පියෙක් වෙයි. ඔහුට ඔහුගේ මිනිස් පියා වෙයි. මෙහි කෙළවරක් නැත. සිංහල ජාතියේ ආරම්භයේ වූ ආදි පියා සොයා යෑම කෙළවරක් නැති ගමනක් බවට පත්වෙයි.

වර්තමානයෙහි ජීවත්වන කසිකබල් පඬිවරුන්ට වඩා ප්‍රඥාවක් එකල වැඩ විසූ සංඝයා වහන්සේට හා එකල ජීවත් වූ ගිහි බෞද්ධයන්ට තිබූ බව පැහැදිලි ය. තම ජාතියේ හෝ ජනවර්ගයේ හෝ ආදිතමයා සත්ත්වයකුගෙන් පැවත එන්නකු බවට ප්‍රවාද, බොහෝ උගතුන් කියන ආකාරයට ජනප්‍රවාද, හෙවත් කතන්දර නිර්මාණය කර ඇත්තේ සිංහලයන් පමණක් නොවේ. බොහෝ ආසියානු අප්‍රිකානු ජනවර්ග තම ආදි මුත්තා සිවුපාවකුගෙන්, එසේත් නැත්නම් පක්ෂියකුගෙන් හෝ ඇතැම් විට ජීවයක් ඇති එහෙත් බෞද්ධයන් සලකන අයුරින් පණක් නැති ගස් කොළන්වලින් පැවත එන බවට කතා හෙවත් ප්‍රවාද නිර්මාණය කර ඇත. මෙයට හේතුව කුමක්දැයි දැනට වසර ගණනාවකට ඉහත දිවයින දිනපතා පුවත්පතට මා විසින් ලියන ලද සිංහබාහු ප්‍රවාදය නම් ලිපියෙහි විස්තර කෙරී ඇත.

සවිඥානික ව තමන් ජනවර්ගයක් හෝ ජාතියක් හෝ ලෙස හඳුනාගත් ජනකොටසක් තම ආදිතමයා ගේ බිහිවීම පිළිබඳ ව ප්‍රවාද ගොඩනගන්නේ කිනම් හෝ ජීව විද්‍යාවකට අනුව නොවේ. එවැනි ප්‍රවාද අයත්වන්නේ ද කිසියම් ජීව විද්‍යාවකට නොව සමාජ හෝ මානව විද්‍යාවකට ය. මේ ප්‍රවාද ගොඩනගන්නේ එකම එක අරමුණකිනි. ඒ අරමුණ අන්කිසිවක් නොව තම ජනවර්ගයේ හෝ ජාතියේ හෝ අනන්‍යතාවය ප්‍රකාශ කිරීම ය. තම අනන්‍යතාවය ප්‍රකාශ කිරීම හෝ තහවුරු කිරීම මගින් තමන් අන්‍ය ජනවර්ගවලින් හා ජන කොටස්වලින් (අප සඳහන් කරන කාලයේ ලෝකයේ පැවතී ඇත්තේ ජාති දෙකක් පමණකි. එක් ජාතියක් සිංහල විය. අනෙක් ජාතිය වූයේ චීන ජාතිය ය. සෙස්සෝ

© Prof. Nalin De Silva

එක්කෝ ජනවර්ග වූහ. එසේත් නැත්නම් හුදු ජන කොටස් වූහ.) වෙන් වූ සුවිශේෂ වර්ගයක් බව පෙන්වීම අදාළ ප්‍රවාද මගින් පැරැන්නෝ බලාපොරොත්තු වූහ. අප මේ ප්‍රවාද විමසිය යුත්තේ මේ අරමුණ සාක්ෂාත් කිරීමේ දී ප්‍රවාද නිර්මාපකයා කෙතරම් සංගත භාවයක් දක්වා ඇත්ද යන කරුණ මත පදනම් ව මිස කිසියම් ජීව විද්‍යාවක් මත පදනම් වී නොවේ.

සත්ත්වයකුගෙන් පැවත එන්නකු එම ආදිතමයා කරගත් වහාම ඒ ආදිතමයාට අනෙක් මිනිසුන්ගෙන් වෙන් වූ අනන්‍යතාවයක් ලැබේ. ඔහු තවදුරටත් පිය පාර්ශ්වයෙන් මිනිසකුගෙන් පැවත නොඑන බැවින් අනෙක් මිනිසුන්ගෙන් වෙන්වෙයි. ඔහු නව මිනිස් පරපුරක ආරම්භකයා වෙයි. සිංහබාහු ප්‍රවාදයේ පමණක් නොව මෙවැනි බොහෝ ප්‍රවාදවල සොහොයුරා සොහොයුරිය විවාහ කර ගැනීමක් ද සිදු වෙයි. සිංහබාහු ප්‍රවාදයේ සිංහබාහු තම නැගණිය වූ සිංහ සීවලී විවාහ කර ගනියි. මෙහි තේරුම කුමක් ද? සොහොයුරා මෙන් ම සොහොයුරිය ද සත්ත්වයකුගේ දරුවෝ වෙති. ඔවුන් දෙදෙනාට ම පිය පාර්ශ්වයෙන් වෙනත් මිනිසුන් සමග සම්බන්ධකමක්, නෑදෑකමක් නැත. වෙනත් අයුරකින් කියන්නේ නම් ඔවුන් දෙදෙනාම පිය පාර්ශ්වය වශයෙන් ගත් කල “ශුද්ධ“ වෙති. එවිට ඔවුන්ගෙන් උපදින දරුවෝ තවත් පරම්පරාවක්වත් “අශුද්ධවීමෙන්” වළකියි.

විජය රජුගේ පියා මෙන් ම මව ද අපේ වංශ කතාවලට අනුව සිංහයකුගේ දරුවන් වීමෙන් මේ ශුද්ධ බව තහවුරු කෙරී ඇත. සිංහබාහු ප්‍රවාදය ගොඩ නැගූ තැනැත්තාට අවශ්‍ය වූයේ සිංහලයන්ගේ සම්භවය වෙනත් මිනිසුන්ගෙන් වෙන් කර දැක්වීම ය. ප්‍රවාදකරු ඉතා මැනවින් හා දක්ෂ ලෙස තම කාර්යය ඉටුකර ඇත. ප්‍රවාදයක් ගොඩ නැගීමේ දී අරමුණට අදාළව සංගත වීමක් අපේක්ෂා කළ යුතු ය. සිංහබාහු ප්‍රවාදයේ වටිනාකම ඇත්තේ සිංහබාහුගේ පියා සිංහයකු කිරීම තුළ ම ය. සිංහබාහුට වෙනත් උප්පැන්නක් සාදා ඔහු තවත් මිනිසකුගේ පුතකු කිරීමෙන් සිංහබාහුට බොරු සෙතක් අත්විය හැකි නමුදු සිංහලයන්ගේ අනන්‍යතාවය ඒ සංශෝධිත ප්‍රවාදයෙන් වැනසී යයි. වත්මන් සිංහලයන්ගේ බොරු පණ්ඩිතකම්වලින් සිංහල ජාතියට කිහිප අතකින් ම අවැඩක් ම සිදුවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva